

පින්තූර විස්තරය: තැළීමෙන් පසු නව චක්‍රයකට ඇතුල් වන ප්ලාස්ටික්

# USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම

USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම (Ocean Plastics Reduction) යනු ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ, පරිසරයට ප්ලාස්ටික් එකතුවීම අවම කිරීම උදෙසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ (SWM) භාවිතයන් වැඩිදියුණු කිරීම සහ ප්ලාස්ටික් භාවිතය සහ යොදාගැනීම් අවම කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන පස් අවුරුදු ව්‍යාපෘතියකි. සාගර ප්ලාස්ටික් දූෂණය කෙරෙහි අවධානය යොමු කරමින්, USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහ 3R (අඩු කිරීම, නැවත භාවිත කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය) ක්‍රියාකාරකම් සඳහා සහය ලබාදෙමින් බලාත්මක කිරීම සහ එම ක්‍රියාවලියන් කළමනාකරණය කිරීම වෙනුවෙන් රජයේ ධාරිතා වැඩි දියුණු කිරීම සිදුකරයි.

RTI ඉන්ටර්නැෂනල් විසින් මෙහෙයවන මෙම ව්‍යාපෘතියේ විවිධ අංශයන්, පද්ධති ශක්තිමත් කිරීමේ ප්‍රවේශයක් භාවිතා කරයි. දේශීය පාර්ශවකරුවන් සමග එක්ව වර්ජින් ප්ලාස්ටික් මත යැපෙන කර්මාන්ත ඉලක්ක කර ගනිමින් එහි අකාර්යක්ෂමතා අවම කිරීමට කටයුතු කරන අතර එමගින් SWM/3R වැඩසටහන් සඳහා පාර්ශව කරුවන්ගේ සහභාගිත්වය වර්ධනය තුලින් පරිසරයට නිරන්තරයෙන් කාන්දු වන ප්ලාස්ටික් ටොන් දහස් ගණනක් වැළැක්වීම අරමුණු කරයි.

## වර්ජින් ප්ලාස්ටික් නිෂ්පාදන සහ භාවිතයන් මත යැපීම අඩු කිරීම

තීරණාත්මක මුල් පියවරක් වන්නේ වර්ජින් ප්ලාස්ටික් ආනයනය අවම කිරීමයි. USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම මගින් සැපයුම් දාමයන් (supply chain) සහ නීති රෙගුලාසි විශ්ලේෂණය කරන අතර, ප්ලාස්ටික් භාවිතය අඩුකිරීම් සඳහා ඇති අවස්ථා සහ බාධක හඳුනා ගනී. මෙම ව්‍යාපෘතිය මගින් ප්ලාස්ටික් භාවිතයන් සඳහා නිෂ්පාදන සහ ක්‍රියාවලි විකල්පයන් සහ ආදේශක ප්‍රවර්ධනය කිරීම, විස්තෘත නිෂ්පාදක වගකීම (EPR), අපවිත්‍රකරුවන් විසින් ගෙවීම (polluter pay) මූලධර්ම සහ ප්ලාස්ටික් යෙදවුම් අවම කරන කරන වෙනත් විකල්ප ප්‍රවේශයන් වැනි ක්‍රියාවලින් සඳහා සහාය වනු ඇත. මෙම ප්‍රයත්නයන් තුලින් තනි භාවිත ප්ලාස්ටික් ආනයනය කිරීමේ ප්‍රමාණය අවම කිරීමට සහ ගෘහ, ප්‍රජා සහ පෞද්ගලික අංශ මට්ටමින් 3R යහ ක්‍රියාවන් ව්‍යාප්තිය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

උදය විජේසෝම/ USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම

## ප්ලාස්ටික් අවම කිරීම වෙන අවධානය යොමු කරමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම, වෘත්තියකරණය සහ ව්‍යාප්තිය පුළුල් කිරීම

ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ අපද්‍රව්‍ය කළමනාකරණ සේවාව එකිනෙක වෙනස් වේ. ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, වෙන් කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බැහැර කිරීම ආදිය සඳහා ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන අවිධිමත් ක්‍රියාකාරීන් (informal actors) ගේ සහය අත්‍යවශ්‍ය සාධකයකි. රාජ්‍ය සහ පෞද්ගලික අංශය සමග සහයෝගීතාවයෙන්, USAID සාගර ප්ලාස්ටික් අවමකිරීම මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සේවා සැපයීමේ ආකෘතිය ශක්තිමත් කරන අතර කසල බැහැර කිරීමේ සෑම අදියරක්ම වෘත්තියකරණය කරමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ ඝන අපද්‍රව්‍ය මිලදී ගැනීම් ප්‍රවර්ධනය කරයි.

ඝන අපද්‍රව්‍ය එකතුකිරීම සඳහා පළාත් පාලන ආයතනවල අයවැයෙන් සැලකිය යුතු කොටසක් වැය වේ. බහුපාර්ශවික ආයතන පදනම් සහ ආයෝජකයින් සමග කාර්යක්ෂම සහසම්බන්ධතා සහ හවුල්කරිත්වයන් තුලින් පළාත් පාලන ආයතනයන් සඳහා අමතර අදායම් රැස්කිරීමේ ක්‍රමවේද නිර්මාණයට මෙම ව්‍යාපෘතිය දායක වේ. මෙම කර්තව්‍යන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම මගින් පරිසරයේ ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම වන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සේවා සඳහා ප්‍රාදේශීය ව ඇති ප්‍රවේශය වැඩිදියුණු වේ.

## දේශීය විසඳුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රජාවන් සවිබල ගැන්වීම

අවිධිමත් ක්‍රියාකරුවන් හෙවත් (informal sector workers) යනු අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ දී අත්‍යවශ්‍යම කොටසක් වන නමුත් තීරණ ගැනීමේදී අවම වශයෙන් නියෝජනය වන කොටසකි. ඔවුන් බොහෝවිට කම්කරුවන් වන අතර අපද්‍රව්‍ය කළමනාකරණ පිරමීඩයේ පදනම වන්නේය. නමුත් ඔවුන් තමන්ට අවශ්‍ය ආරක්ෂිත සේවා තත්වයන් ලබාගැනීමට පවා අරගල කරයි. ස්ත්‍රීන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට (gender-based violence) ගොදුරු වන අතර ඉහල තනතුරකට පත්වන්නේ ඉතා කලාතුරකිනි. මෙම ආන්තික වූ ක්‍රියාකාරීන් කෙතරම් වැදගත් ද යන්න අවබෝධ කර ගනිමින්, USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම තුලින් ස්වාධීන අපද්‍රව්‍ය එකතු කරන්නන් සහ කාන්තාවන් විසින් පවත්වාගෙන යන ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාර සඳහා සහාය වනු ඇත.

ප්‍රජා සවිබල ගැන්වීම සඳහා ප්‍රජා උපදේශන මට්ටමින් ඉහලට යමින් මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලින්, ව්‍යාපාර සහ සේවා සඳහා සහාය වනු ඇත. එමෙන්ම 3R ක්‍රියාකාරකම් සඳහා ඇති අවස්ථා හඳුනා ගැනීමට මෙන්ම ප්‍රජා සහභාගිත්වය වැඩි කිරීම වෙනුවෙන් ඵලදායි ලෙස කසල ගොඩගැසීම, එකතු කිරීම, වෙන් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය සමඟ වැඩ කිරීමට ප්‍රජාවන් දිරිමත් කරනු ඇත. එතුලින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ හිමිකාරිත්වය සහ ඒ සම්බන්ධව ධනාත්මක සමාජ ආකල්ප සහ හැසිරීම් වෙනස්කම් ප්‍රවර්ධනය කිරීමක් සිදුවේ. සාමූහිකව, මෙම ප්‍රයත්නයන් ප්‍රජාව තුල අපද්‍රව්‍ය අවම කිරීමට සහ 3R මූලධර්මවලට අනුබල දෙන කළමනාකරණ භාවිතයන් වැඩි කිරීමට උපකාරී වනු ඇත.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය සක්‍රීය පරිසරය ශක්තිමත් කිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට සක්‍රීය පරිසරයක් තිබීම අත්‍යවශ්‍ය වනබව වටහාත් නිසා USAID සාගර ප්ලාස්ටික් අවම කිරීමේ ක්‍රියාකාරකම මගින් ඝන අපද්‍රව්‍ය වලට අදාලව ඇතිවිය හැකි ආපදා හා බලපෑම් අවම කිරීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින දේශීය ධාරිතාව වර්ධනය කිරීමට අවධානය යොමු කරයි. එහිදී අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රජයේ පවතින දත්ත එකතු කිරීම හා විශ්ලේෂණ හැකියාව ශක්තිමත් කිරීමට අවශ්‍ය වන්නේය. ප්‍රාදේශීය, කලාප සහ ජාතික රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවේශයන් පරිපාලනය කිරීම වැඩිදියුණු කරන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමට ප්‍රමුඛතාවය දෙනු ලබයි. ප්‍රාදේශීයව ධාරිතා ගොඩනැගීමට මුල්තැන දෙමින් පවතින පද්ධති හා ක්‍රියාවලි ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර හවුල්කාරිත්වයන් ගොඩනැගීම තුලින් ආපදාවන්ට ශක්තිමත් ව මුහුණදීමේ හැකියාව වර්ධනය කිරීමට ව්‍යාපෘතිය බලාපොරොත්තු වන්නේය.

මෙම ප්‍රයත්නයන් මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සිදුවන අතර සහ කාර්යක්ෂමව තීරණ ගැනීමේදී දත්ත ලබා ගැනීමේ හැකියාව මෙන්ම ඝණ අපද්‍රව්‍ය ආශ්‍රිත ව ඇතිවිය හැකි ව්‍යසන සහ බලපෑම්වලට මුහුණ දීමට ඇති ප්‍රාදේශීය හැකියාව සහ ධාරිතාව වර්ධනය කරයි.